රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 17/2026

මගේ අංකය : SLAS/R/Merit/2026
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2026.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## කුසලතා ධාරාව යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට කුසලතා ධාරාව යටතේ පුරප්පාඩු 10ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම නිවේදනයේ ''ලේකම්'' යන පදයෙන් අදහස් කෙරෙන්නේ ''රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්'' වේ. ''සේවය'' යන පදයෙන් අදහස් කරනුයේ ''ශ්‍රී ලංකා පරිපාලන සේවය'' වේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය :

බඳවා ගැනීම් සිදු කරනුයේ ලිඛිත විභාගයක්, ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳව කරනු ලබන ඇගයීමක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබා ගන්නා ලකුණුවල මුළු එකතුව සලකමිනි.

ඒ අනුව, ලිඛිත විභාගයට, ජ්‍යෙෂ්ඨත්වයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ලබාගත් ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින්, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

මෙහිදී බඳවා ගැනීම්වලට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය වන විට අයදුම්කරුවන් විසින් නියමිත සුදුසුකම් සපුරා තිබේ ද යන්න පිළිබඳව ද සලකා අදාළ පුරප්පාඩු පුරවනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

2.1 ලිඛිත විභාගය :

පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ.

1. සාමාන්‍ය බුද්ධිය.
2. ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.
3. රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

2.2 විභාග දිනය :

මෙම විභාගය 2026 නොවැම්බර් මස කොළඹදී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

2.3 සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගයට හා ජ්‍යෙෂ්ඨතාවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සඳහා සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

03. සේවා කොන්දේසි :

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3.3 මෙම පත්වීම එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.4 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

04. මාසික වැටුප් පරිමාණය:

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.82,150-10x2,400-8x2,940-17x3,900 -195,970/- ( SL-1-2025) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

05. බඳවා ගැනීමේ සුදුසුකම් :

5.1 <u>අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද</u> :

i. කළමණාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ හෝ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයක අධි පන්තියේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක නිලධාරියකු වීම.

හෝ

ii. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ හෝ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයක හෝ පළමුවන ශ්‍රේණියේ (I ශ්‍රේණියේ) වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත එම සේවයක වසර විස්ස (20) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියකු වීම.

<u>සටහන :</u>

මෙහිදී සේවා කාලය ගණනය කිරීමේදී රාජ්‍ය සේවයේ සහ / හෝ පළාත් රාජ්‍ය සේවයන්හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ. අධි සේවක පදනම මත කිසියම් තනතුරකට පත්කරනු ලැබූ අවස්ථාවන් හෝ පත්වීම් පෙරදාතම් කරනු ලැබූ අවස්ථාවන් හෝ තනතුරක වැඩබැලීමක් / රාජකාරි ඉටුකිරීමක් සිදුකරනු ලැබූ අවස්ථාවන් හෝ ජ්‍යෙෂ්ඨතා ලකුණු ගණනය කිරීමේදී සලකා නොබලන අතර ඒ සඳහා නිත්‍ය තනතුර පමණක් පදනම් කරගනු ලැබේ.

5.2 <u>වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම්</u> :

i. අවුරුදු පනස් පහ (55) ට නොවැඩි විය යුතුය.

ii. ඉහත 5.1 හි සඳහන් සේවයක/තනතුරක ස්ථිරත්වය ලබා තිබීම.

iii. සතුටුදායක සේවා වාර්තාවක් ඇති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා එහි සංශෝධනයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව තම මුළු සේවා කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම.

iv. පූර්වාසන්න වසර පහ (05) තුළ සියලුම වැටුප් වර්ධක සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනට උපයාගෙන තිබීම.

5.3 <u>සුදුසුකම් පිළිබඳ සීමාවන්</u> :

i. කුසලතා තරග විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටිමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත.

ii. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2026.08.10 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iii. කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

iv. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පෙර සේවයෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරීන් මෙම තරග විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

6.1 <u>ලිඛිත විභාගය</u> :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන (03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයය සමත් වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

| | විෂයය | කාලය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | පැය 1 ½ | 100 | 50 |
| 2 | ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති | පැය 3 | 100 | 50 |
| 3 | රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 3 | 100 | 50 |

විෂය නිර්දේශය :

i. සාමාන්‍ය බුද්ධිය

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යූහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ii. ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යූහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

iii. රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යූහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

<u>6.2 ජ්‍යෙෂ්ඨත්වය</u>.

ජ්‍යෙෂ්ඨත්වය සඳහා දෙන උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි. ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ.

(අ)

i. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ තනතුරක සේවය කළ එක් වර්ෂයකට ලකුණු දහය (10) බැගින්.

ii. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I පන්තියේ නිලධාරීන් සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වසර විස්ස (20) ක සක්‍රිය සේවා කාලයෙන් පසු සෑම වසරකටම ලකුණු අට (08) බැගින්.

(ආ) ලකුණු හිමි වනුයේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණි.

(ඇ) මාස හයකට වඩා අඩු කිසිදු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ. එහෙත් මාස 06 කට වැඩි අවුරුද්දකට අඩු සේවා කාලයක් සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධරයකුට ලකුණු පහ (05) බැගින් ද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I පන්තියේ නිලධරයකුට ලකුණු හතර (04) බැගින් ද හිමි වේ.

(ඇ) අධි සේවක පදනම මත කිසියම් තනතුරකට පත්වීම් ලැබූ හෝ පත්වීම් පෙරදාතම් කරනු ලැබූ දිනයන් ජ්‍යෙෂ්ඨතා ලකුණු ගණනය කිරීමේදී සලකා බලනු නොලබන අතර, ඒ සඳහා සේවා කාලය ගණන් බලනු ලබන්නේ අදාළ තනතුරෙහි වැඩ භාරගත් දිනය පදනම් කර ගෙනය.

(ඉ) ඉහත කළමනාකරණ සේවා නිලධාරී සේවයේ හෝ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියේ නිලධරයකුගේ ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ගණනය කිරීමේදී ඉහත අ (ii) මඟින් ආවරණය වන යම් කාල සීමාවක් වේ නම් ඒ සඳහා ද අදාළ ලකුණු ප්‍රමාණය ගණනයේදී හිමි වේ.

(ඊ) මෙම චක්‍රලේඛයේ 6.1 වගන්තියේ දැක්වෙන ලිඛිත විභාගයෙහි විෂයයන් 3 ටම ලකුණු 50 ට හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගන්නා ලද අයදුම්කරුවන් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨතා ලකුණු ගණනය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ලේකම් විසින් සිදු කරනු ලැබේ. එහිදී දැනුම් දුන් පසු අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් සත්‍ය බවට සහතික කළ පහත සඳහන් ලේඛන ලේකම් වෙත යොමු කළ යුතුය.

1. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයක කළමනාකරණ සේවා නිලධාරී, ලිපිකරු, ලඝු ලේඛන, යතුරු ලේඛන, පොත් තබන්නා, සරප්, ගබඩා භාරකාර සේවයන්ට මුලින්ම පත්කරනු ලැබූ පත්වීම් ලිපිය සහ වැඩ භාරගැනීමේ ලිපි.
2. අදාළ උසස්වීම් ලිපි (II පන්තිය, I පන්තිය, අධිපන්තිය)
3. අධිපන්තියේ වැඩ භාරගැනීමේ ලිපිය.
4. පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රජයේ මුදාහැරීමක් සිදු වී තිබේ නම් ඒ පිළිබඳ විස්තර.
5. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය
6. විනය නියෝග පිළිබඳ විස්තර
7. සේවය ස්ථිර කිරීමේ ලිපිය
8. ආයතන ප්‍රධානියා විසින් සහතික කර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපත.
9. සේවය සනාථ කිරීමේ ලිපිය

6.3 සම්මුඛ පරීක්ෂණ.

සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

(i) අයදුම්කරුවන් විසින් ඉහත අංක 05 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සටහනෙහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග, සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු විසිපහ (25) කි.

| | විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතාව | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂත්වය | 05 |
| | එකතුව | 25 |

I. එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව සහ ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලැබූ ලකුණු යන දෙකෙහිම මුළු ලකුණු අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව, ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩුවන අවස්ථාවකදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර, එහි දී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බවට සනාථ වූ අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබුවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

III. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනට පෙර සේවයෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

<u>සැලකිය යුතුයි :</u>

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පත් මඟින් (Any Bank Credit Cards)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පත් මඟින් (Any Bank Debit Card with internet payment facility)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මඟින් (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Bank of Ceylon Teller Slip Payment)

සටහන : ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මෙම විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 14 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 14 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.

(ආ) අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions)

බාගත කර අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතුය. නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන අයදුම්පත් කාර්යාලයට ලැබුණ දිනයේදීම කාර්යාලයීය දින මුද්‍රාව තැබීමත්, අපේක්ෂකයන් සඳහන් කරන තොරතුරු නිවැරදි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිල මුද්‍රාව තබා සහතික කර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීමයි.

(ඇ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහරිනු ලැබ ඇති/ සේවය සඳහා ද්විතීයනය කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කර ඉහත දැක්වෙන ආකාරයට කටයුතු කළ යුතුය.

(ඉ) අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

(ඊ) විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධ සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

(උ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. විභාග ප්‍රවේශ පත්‍ර:

ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය

වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී, සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

10. විභාගයට ඇතුළත්වීම :

(අ) මෙම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය, අදාළ ශාලාධිපති වෙත භාර දිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

සටහන - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව

ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කෙරේ. අපේක්ෂකයකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

13. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රාජ්‍ය සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබා ගැනීමේ විභාගය / සම්මුඛ පරීක්ෂණය සමත්වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

සටහන -

i. අපේක්ෂකයකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
ii. අයදුම්පතෙහි සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.


15. පත්වීම් පිරිනමන අවස්ථාව වන විට බලපවත්වන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ හෝ අසතුටුදායක, වැඩ හැසිරීම් කරණ කොට ගෙන හෝ කිසියම් අපේක්ෂකයකු පත්වීම ලැබීමට සුදුසුකම් නොලබනු ලැබුවහොත්, එම පත්වීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

16. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

17. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

18. මෙම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,



එස්. ආලෝකබණ්ඩාර

ලේකම්

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-698605

විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com